සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

### 11 - ශ්‍රේණිය

### ව්‍යවසායකත්ව අධ්‍යයනය - I, II

නම/විභාග අංකය : ........................................................................ කාලය : පැය 03 යි.

## I පත්‍රය

**සැලකිය යුතුයි :**

- සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා උත්තර පත්‍රයේ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැලපෙන කවය තුළ ' x ' ලකුණ යොදන්න.

01. නව්‍යතා සම්පාදනය සිදුකරන්නා,

1. නිෂ්පාදකයා වේ.
2. ව්‍යාපාරිකයා වේ.
3. ව්‍යවසායකයා වේ.
4. සැලසුම්කරුවා වේ.

02. පහත සඳහන් ඒවායින් 'වුවමනාවක්' ලෙසට දැක්විය හැක්කේ,

1. ඇඳුම් - පැළඳුම්
2. ආහාර - පාන
3. අධ්‍යාපනය හා ආරක්ෂාව
4. සාරි හා ගවුම

03. අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ක්‍රම හා ස්වරූප,

1. වුවමනා වේ.
2. නිෂ්පාදිත වේ.
3. භාණ්ඩ හා සේවා වේ.
4. පුද්ගල ආකල්ප වේ.

04. සංවිධානයක කළමනාකරු 'වැටුප්' උපයන අතර, ව්‍යවසායකයාගේ ප්‍රතිලාභ,

1. ලාභාංශ වේ.
2. ලාභ වේ.
3. ආදායම් වේ.
4. වැටුප් හා වේතන වේ.

05. ව්‍යවසායකයා නිරතුරුවම විශ්වාසය තබා ගන්නේ,

1. තමා කෙරෙහිය.
2. සැපයුම්කරුවන් කෙරෙහිය.
3. සේවකයින් කෙරෙහිය.
4. කළමනාකරුවන් කෙරෙහිය.

06. ''මා උත්සාහ කරන කටයුත්තක් සාර්ථක වේ යැයි දැඩිසේ විශ්වාස කරමි.'' මෙය ව්‍යවසායකයකුගේ කුමන ගතිලක්ෂණයක් ද?

1. සුභවාදී වීම වේ.
2. අධිෂ්ඨානය වේ.
3. ආත්ම විශ්වාසය වේ.
4. දැක්ම වේ.

07. ''අවශ්‍ය අවස්ථාවලදී මම මගේ තීරණ වෙනස් කර ගැනීමට පසුබට නොවෙමි.'' මෙය ව්‍යවසායකයකුගේ කිනම් ගතිලක්ෂණයක් ද?

1. නිර්මාණශීලීත්වය වේ. 2. නම්‍යශීලීත්වය වේ.
3. සාමාන්‍ය වැටහීම වේ. 4. පරිසර සංවේදී බව වේ.

08. ගැටලු සඳහා නව ආකාරයක විසඳුම් ලබා දීමට වවවසායකයාට පවතින හැකියාව,

1. නම්‍යශීලිත්වය වේ 2. නිර්මාණශීලිත්වය වේ.
3. තාක්ෂණික හැකියාව වේ. 4. අනාගත දැක්ම වේ.

09. ''යම් ගැටලුවකට එකම විසඳුමක් පමණක් ඇතැයි සිතා කටයුතු කිරිම'',

1. නිර්මාණශීලිත්වයට උත්තේජනයකි. 2. නිර්මාණශීලිත්වයට බාධාවක් නොවේ.
3. නිර්මාණශීලිත්වයට බාධාවක් වේ. 4. සම්ප්‍රදායික බව රැකීමක් වේ.

10. කිසියම් කාර්යක් අසාර්ථකත්වයට පත්වීම ව්‍යවසායකයන් දකින්නේ.

1. සම්පත් අපතේ යාමක් හැටියට ය. 2. අකාර්යක්ෂමතාවයක් ලෙසට ය.
3. අත්දැකීම් ලැබීමක් ලෙසට ය. 4. පරාජයක් ලෙසට ය.

11. ඕනෑම සංවිධානයකට පොදු වූ ලක්ෂණයක් වන්නේ,

1. අරමුනක් පැවතීම ය. 2. නෛතිකභාවයක් පැවතීම ය.
3. ලාභ උපරිම කර ගැනිම ය. 4. වගකීම අසීමිත විම ය.

12. ''පාරිභෝගිකයාට සාමාන්‍ය ක්‍රමයට විකිණීම සිදු කළ මහින්ද, ස්වයං සේවා ක්‍රමයට භාණ්ඩ අලෙවි කිරීමට යොමු විය.'' මෙය කුමන ආකාරයක නවෝත්පාදනයක් ද?

1. නව සොයා ගැනීමකි. 2. සංකලනයකි.
3. අනුකරණයක් වේ. 4. දිගුවක් වේ.

13. ''අප රටේ පෞද්ගලික අංශයේ ඇතැම් මූල්‍යායාතන තැන්පත් සඳහා ඉහළ පොළී ප්‍රතිශතයක් ලබා දී තිබියදීත් ඇතැම් තැන්පතු කරුවන් රාජ්‍ය අංශයේ මූල්‍ය ආයතන වල ඊට වඩා අඩු පොළී ප්‍රතිශතයක් යටතේ තැන්පතු පවත්වා ගෙන යයි. '' - මෙසේ වන්නේ,

1. ප්‍රතිලාභය පහළ වුවද, අවදානම පහළ මට්ටමක පැවතිම වේ.
2. ප්‍රතිලාභය පහළ වුවද, අවදානම ඉහළ මට්ටමක පැවතිම වේ.
3. තැන්පතු ලබා ගැනීමේ හැකියාව ඉක්මනින්ම කළ හැකි විම.
4. අවදානම් පහළ වුවද ප්‍රතිලාභය ඉහළ මට්ටමක පැවතිමය.

14. තමන්ට පැවරී ඇති ව්‍යාපාරික කාර්යන් ඉටු කර දීමට කටයුතු කරන පුද්ගලයන් එම ව්‍යාපාරයේ,

1. හිමිකරුවන් වේ. 2. සේවකයන් වේ.
3. ව්‍යවසායකයින් වේ. 4. සැපයුම්කරුවන් වේ.

15. පාසල් හැර ගිය අය උදෙසා වෘත්තීය පාඨමාලා ක්‍රියාත්මක කිරීම,

1. ව්‍යාපාර ව්‍යවසායකත්වය වේ. 2. ආයතනික ව්‍යවසායකත්වය වේ.
3. සමාජීය ව්‍යවසායකත්වය වේ. 4. සමාජ වගකීම් ව්‍යවසායකත්වය වේ.

16. ව්‍යාපාරික අරමුණු හා පරමාර්ථ ද ඒවා ඉටු කර ගන්නා ආකාරය ද ඇතුලත් කරමින් පිළියෙල කරනු ලබන වාර්තාව,

1. මුදල් ප්‍රවාහ සැලැස්ම වේ. 2. විධායක සාරාංශය වේ.
3. මූල්‍ය ඇස්තමේන්තුව වේ. 4. ව්‍යාපාර සැලැස්ම වේ.

17. ව්‍යාපාරික කටයුතු සාර්ථක ව ඉදිරියට පවත්වා ගැනිමට කළ හැකි වන්නේ,

1. මූල්‍ය ශක්තිය ඉහළ මට්ටමකින් පවතින විටයි.
2. සේවක උනන්දු ඉහළ මට්ටමක පවතින විටයි.
3. සැලැස්මකට අනුව ව්‍යාපාරික කටයුතු මෙහෙවවීම මතයි.
4. පාරිභෝගිකයින් සමඟ සුහදශීලිව කටයුතු කිරීම මතය.

18. ව්‍යාපාරය සමස්ථයක් ලෙසට සලකා සැලසුම් සහගතව ව්‍යාපාරික කටයුතු පවත්වා ගැනීමට ව්‍යවසායකයකුට පවතින කුසලතාව,

1. උපදේශන කුසලතාව වේ. 2. සංකල්පනාත්මක කුසලතාව වේ.
3. සන්නිවේදන කුසලතාව වේ. 4. තාක්‍ෂණික කුසලතාව වේ.

19. ව්‍යවසායකත්වය තුළින් රටක සමස්ථ නිෂ්පාදනය ඉහළයාම,

1. පෞද්ගලික මට්ටමේ ප්‍රතිලාභ හිමිවීමකි.
2. ජාතික මට්ටමේ ප්‍රතිලාභ හිමිවීමකි.
3. ප්‍රාදේශීය මට්ටමේ ප්‍රතිලාභ හිමිවීමකි.
4. සමාජ සුභසාධනයට අඳාළ ප්‍රතිලාභ හිමිවීමකි.

20. කුඩා පරිමාණ ව්‍යාපාර වල දක්නට ලැබෙන 'සීමාකාරී' සාධකයක් වන්නේ,

1. වෙළෙඳපොළ පටුවීම. 2. ණය ලබා ගැනීම් වලට යොමු නොවීම.
3. පවුලේ සාමාජිකයින්ගේ මැදිහත් වීම. 4. ව්‍යාපාරික තීරණ ඉක්මනින්ගත හැකිවීම.

21. 'අභ්‍යන්තර ව්‍යාපාර පරිසරය' විශ්ලේෂණය කිරීමෙන් හඳුනාගත හැකි වන්නේ,

1. ශක්තීන් හා තර්ජන වේ. 2. දුර්වලතා හා අවස්ථා වේ.
3. ශක්තීන් හා දුර්වලතා වේ. 4. තර්ජන හා දුර්වලතා වේ.

22. මූල්‍ය ආයතන ණය සැපයීමේ දී අයකරන ණය පොළී අනුපාතය 15% සිට 12% දක්වා පහත හෙළීම,

1. ව්‍යාපාරවලට 'ශක්ති' ලෙසට බලපානු ලබයි.
2. ව්‍යාපාරවලට 'අවස්ථා' උදාවීමක් සිදු කරයි.
3. ව්‍යාපාරවල කළමනාකරණය යහපත් වේ.
4. ව්‍යාපාරවලට අවාසිදායකව බලපෑම් ඇති කරයි.

23. ව්‍යවසායකයින්ගේ නව නිර්මාණ වෙනුවෙන් රජය විසින් ලබාදෙන සහතිකය,

1. එස්.එල්.එස්. (S.L.S) සහතිකය වේ. 2. පේටන්ට් බලපත්‍රය වේ
3. ISO සහතිකය වේ 4. ISO 14000 සහතිකය වේ

24. ව්‍යවසායකයකු තම ව්‍යාපාරයේ 'ශක්ති' හඳුනාගැනීම සඳහා විශ්ලේෂණය කළ යුත්තේ,

1. ආසන්න පරිසරයයි. 2. බාහිර පරිසරයයි.
3. අභ්‍යන්තර පරිසරයයි. 4. තාක්‍ෂණික පරිසරයයි.



පළාත

25. රජය අන්තර්ජාතික ගිවිසුම්වලට එකඟවීම තුලින් දේශීය ව්‍යවසායකයින්ට අවස්ථා උදාවීමක් සිදුවේ. මෙය හඳුනාගත හැකි පරිසරය වන්නේ,

| | | | |
|---|---|---|---|
| 1. | ගෝලීය පරිසරය වේ. | 2. | ආර්ථික පරිසරය වේ. |
| 3. | දේශපාලන හා නෛතික පරිසරය වේ. | 4. | ආසන්න පරිසරය වේ. |

26. ව්‍යාපාරයක නීතිමය වගකීමක් වන්නේ,

1. සේවක අර්ථසාධක අරමුදල් නිසිලෙස ගෙවීම වේ.
2. සේවක වැටුප් ඉහළ දැමීම වේ.
3. තරඟකාරී මිලට භාණ්ඩ හා සේවා විකිණීම වේ.
4. සේවක උනන්දුව වැඩිවන ආකාරයේ පෙළඹවීම් සිදු කිරීම වේ.

27. සංචාරක සේවා සපයන ව්‍යාපාර අයත් වන්නේ,

| | | | |
|---|---|---|---|
| 1. | ද්විතීයික අංශයට ය | 2. | ප්‍රාථමික අංශයට ය |
| 3. | කාර්මික අංශයට ය | 4. | තෘතීයික අංශයට ය |

28. වෙළෙඳපොළ විශ්ලේෂණය තුලින් ව්‍යවසායෙකුට හඳුනාගත හැකි ක්ෂේත්‍රය වන්නේ,

1. තරඟකරුවන්ගේ වෙළෙඳපොළ කොටස හා ඔවුන්ගේ වෙළෙඳ උපක්‍රම වේ.
2. නිෂ්පාදන කටයුතු සඳහා වැයවේ යැයි අපේක්ෂා කරන පිරිවැය දත්ත වේ.
3. කාලච්ඡේදය අවසානයේ ශුද්ධ මුදල් ප්‍රවාහය වේ.
4. මෙහෙයුම් පෙර ආයෝජන වියදම් සම්බන්ධ තොරතුරු වේ.

29. අලෙවිකරණ උපාය මාර්ගයට ඇතුළත් නොවන්නේ,

| | | | |
|---|---|---|---|
| 1. | නිෂ්පාදිතය | 2. | ප්‍රවර්ධනය |
| 3. | ස්ථානය | 4. | නිෂ්පාදිත ඇසුරුම |

30. අලෙවි සැලැස්මට ඇතුළත් කරන වියදම් වර්ගයක් වනුයේ,

| | | | |
|---|---|---|---|
| 1. | පරිපාලන සේවක වැටුප් ය. | 2. | බෙදාහැරීම් සේවක වැටුප් ය. |
| 3. | නිෂ්පාදන සේවක වැටුප් ය. | 4. | බැංකු ණය සඳහා පොලී ගෙවීම් ය. |

31. නිෂ්පාදන ව්‍යාපාරයක, නිෂ්පාදන යන්ත්‍ර උපකරණ ක්ෂයවීම් යනු නිෂ්පාදනයට අදාල,

1. ද්‍රව්‍ය වියදම් අයිතමයකි.
2. ශ්‍රම වියදම් අයිතමයකි.
3. නිෂ්පාදනයට වැය වූ ද්‍රව්‍ය වියදම්, ශ්‍රම වියදම් හැර වෙනත් වියදම් අයිතමයකි.
4. වියදම් අයිතමයක් නොවේ.

- 32 හා 33 ප්‍රශ්න වලට පහත විස්තරය අනුව පිළිතුරු සපයන්න.

ඉදිරි මාසයේ නිෂ්පාදිත ඒකක ප්‍රමාණය 2000 ක්ද භාණ්ඩ ඒකකයක නිෂ්පාදන පිරිවැය රු. 40 ක් වේ යැයි ඇස්තමේන්තු කර ඇත. ද්‍රව්‍ය සඳහා වියදම රු. 18 000 ද, නිෂ්පාදනයට අදාල වෙනත් වියදම් රු. 16 000 ද වේ.

32. නිෂ්පාදනයට අදාල ශ්‍රම වියදම් ප්‍රමාණය වන්නේ,

| | | | |
|---|---|---|---|
| 1. | රු. 62 000 කි. | 2. | රු. 46 000 කි. |
| 3. | රු. 80 000 කි. | 4. | රු. 114 000 කි. |

33. මුළු නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තුව,

1. රු. 80 000 කි.
2. රු. 34 000 කි.
3. රු. 114 000 කි.
4. රු. 96 000 කි.

34 අලෙවි ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමට පෙර ව්‍යවසායකයින් විසින් සිදු කරනුයේ,

1. වෙළෙඳපොළ සමීක්ෂණයක නිරත වීමයි.
2. මූල්‍ය ආයතනයකින් උපදෙස් ලබා ගැනිමයි.
3. සැපයුම්කරුවන්ගෙන් තොරතුරු විමසීමයි.
4. වෙළෙඳපොළ හිඩැස පිරවීමයි.

35. ඉලක්ක පාරිභෝගික කොටස යනු ව්‍යවසායකයා ඉදිරිපත් කරන භාණ්ඩය හෝ සේවාව,.

1. දැනටමත් පරිභෝජනය කරන කොටස වේ.
2. අනාගතයේ දී පරිභෝජනය කරන කොටස වේ.
3. ප්‍රචාරණය තුළින් අද්දවා ගත හැකි පාරිභෝගික කොටස වේ.
4. දැනට පරිභෝජනය කරන කොටස හා අනාගතයේ දී පරිභෝජනය කරන කොටස යන සියල්ලමය.

36. ව්‍යවසායකයකුට අතිරේක ප්‍රාග්ධන සම්පාදනය සිදු කර ගත හැකි බලපත්‍රලාභී දේශීය වාණිජ බැංකුවක් වන්නේ,

1. ජාතික ඉතිරිකිරීමේ බැංකුව
2. හැටන් නැෂනල් බැංකුව
3. පීපල්ස් ලීසිං ආයතනය
4. ලංකා බැංකුව

37. ව්‍යවසායකයකු අතිරේක ප්‍රාග්ධන සම්පාදනයක් සිදු ගැනීමේ දී අදාල මූල්‍ය ආයතනය වෙත ලබාදිය යුතු තොරතුරක් නොවන්නේ මින් කවරක් ද?

1. ණය මුදල කුමන කාර්යයක් සඳහා භාවිතා කරන්නේද? යන්න.
2. ණය මුදල ලබා ගැනීමේ දී ඉදිරිපත් කළ යුතු ඇප කොන්දේසි මොනවාද? යන්න.
3. ණය මුදල ආපසු ගෙවීමට ගතවන කාලය කොපමණද? යන්න.
4. ව්‍යාපාරයේ කළමනාකරුවන් පිළිබඳ මූලික තොරතුරු

38. ව්‍යවසායකයකු විසින් ආකර්ශණය කර ගැනීම සඳහා ලබාදිය යුතු නිෂ්පාදිත,

1. ගුණාත්වයෙන් අඩු හා මිලෙන් අඩු ඒවා විය යුතුය.
2. ගුණාත්වයෙන් වැඩි හා මිලෙන් වැඩි ඒවා විය යුතුය.
3. ගුණාත්වයෙන් වැඩි හා මිලෙන් අඩු ඒවා විය යුතුය.
4. ගුණාත්වයෙන් අඩු ප්‍රමාණයෙන් වැඩි හා මිලෙන් අඩු ඒවා විය යුතුය.

39. මූල්‍ය සැලැස්මේ ඇතුළත් කළ යුතු මෙහෙයුම් පෙර වියදම් ඇස්තමේන්තු වර්ගයක් වන්නේ,

1. නිෂ්පාදන සේවක වැටුප් හා වේතන වේ.
2. වෙළෙඳපොළ සමීක්ෂණ වියදම් වේ.
3. අලෙවි ප්‍රවර්ධන වියදම් වේ.
4. නිෂ්පාදන අමුද්‍රව්‍ය සඳහා වූ වියදම් වේ.

40. ව්‍යාපාරයක අපේක්ෂිත මුදල් ලැබීම් හා අපේක්ෂිත මුදල් ගෙවීම් අන්තර්ගතව ඇති ලේඛණය,

1. බැංකු ජංගම ගිණුම වේ.
2. ඇස්තමේන්තු ගත මූල්‍ය සැලැස්ම වේ.
3. ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහ සැලැස්ම වේ.
4. මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් ජ'නලය වේ.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

### 11 - ශ්‍රේණිය

### ව්‍යවසායකත්ව අධ්‍යයනය - II

නම/විභාග අංකය : ..........................................................................

- පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

01. අ) සුසන්ත ලී කැටයම් නිර්මාණ ශිල්පියෙකි. ඔහු නිවාස ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ට හා ලී බඩු නිෂ්පාදකයන්ට තරඟකාරී නිෂ්පාදිත අභිබවා නවතම මෝස්තර වලින් ලී කැටයම් සපයන සාර්ථක ව්‍යාපාරිකයෙකි. කලට වේලාවට වැඩ කිරීමටත්, ඇනවුම් කළ වේලාවට හා සාධාරණ මිලකට සපුරාලීමටත් ඔහු වගබලා ගනියි.

(i) සුසන්ත සතු ව්‍යවසායකත්ව ගුණාංග දෙකක් සඳහන් කරන්න.

(ii) සුසන්තගේ වෙළෙඳපොළ කොටස කුමක් ද?

(iii) මෙම ව්‍යාපාරය ගණුදෙනුකරුවන් අතර ජනප්‍රිය වීමට බලපෑ හේතු දෙකක් ඉදිරිපත් කරන්න.

(iv) සුසන්තගේ ව්‍යාපාරය තව දුරටත් සාර්ථක කර ගැනීමට ඔබට ඉදිරිපත් කළ හැකි යෝජනා දෙකක් ලියන්න.

ආ) 2020 ජූනි 30 න් අවසන් වන මාසයේ සුසන්තගේ ඇස්තමේන්තු ගත ව්‍යාපාරික තොරතුරු පහත පරිදි වේ.

| අයිතමය | වටිනාකම (රු.) |
|---|---|
| විකුණුම් ආදායම් | 600 000 |
| අමුද්‍රව්‍ය පිරිවැය | 185 000 |
| ශ්‍රම පිරිවැය | 50 000 |
| වෙනත් නිෂ්පාදන පිරිවැය | 15 000 |
| විකුණුම් වියදම් | 24 000 |
| බැංකු ණය ලබා ගැනීම | 250 000 |

ඉහත තොරතුරු අනුව සුසන්තගේ ව්‍යාපාරයේ,

(v) මුළු නිෂ්පාදන පිරිවැය ලේඛනය

(vi) මුළු පිරිවැය ලේඛනය

(vii) ඉදිරි මාසයේ ශුද්ධ ලාභය ගණනය කිරීමේ ලේඛනය

(viii) ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහ සැලැස්ම (ලකුණු 20)

02. ''ගැටලු හා අවස්ථා දෙස බලා ඒවාට විසඳුම් ලෙස නව මාර්ග සොයා ගැනීමට ඇති හැකියාව නිර්මාණශීලිත්වය වේ.''

1- පහත සඳහන් ගැටලු විසඳීමේ නිර්මාණාත්මක විසඳුමක් බැගින් ඉදිරිපත් කරන්න.

අ) ඔබ පාසලේ හෝ ගෙවත්තේ එක් රැස්වන කුණු කසල
ආ) මදුරුවන් බෝ වීම

2- පුද්ගලයාගේ සිත තුල ජනිතවන නිර්මානශීලිත්වයට බාධාවන අදහස් හෝ සිතුවිලි දෙකක් සඳහන් කරන්න.

3- නිර්මාණශීලීත්වය වර්ධනය කර ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

4- නිර්මාණශීලී නිෂ්පාදන වල හිමිකම වෙනුවෙන් රජය විසින් ලබාදෙන සහතිකය කුමක් ද?
එම සහතිකය හිමිකර කර ගැනීම තුලින් ලබන වාසිය කවරක් ද?

5- ව්‍යාපාර ව්‍යවසායකයාට ඉදිරිපත් කළ හැකි නව්‍යතා දෙකක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 2x5=10)

03.(i) ව්‍යාපාරික කටයුතු සිදු කරන ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර පවතින සමානකම් දෙකක් ඉදිරිපත් කරන්න. (ලකුණු 02)

(ii) පහත සඳහන් ශීර්ෂ යටතේ ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර වෙනස ඉදිරිපත් කරන්න.

(අ) ව්‍යාපාර කටයුතුවල යෙදෙන ආකාරය
(ආ) අවදානම්භාර ගැනීම
(ඇ) තරගයට මුහුණ දීම
(ඈ) ගණුදෙනුකරුවන්ට භාණ්ඩ විකිණීම (ලකුණු 08)

(මුළු ලකුණු 10)

04 1-'ලාභය' අරමුණු කරගත් හා 'ලාභය' අරමුණු කර නොගත් ව්‍යාපාරයන් සඳහා නිදසුන් දෙන බැගින් ඉදිරිපත් කරන්න.

2- කුඩා පරිමාණ ව්‍යාපාරයක දක්නට ලැබෙන ලක්ෂණ වලින් දෙකක් ඉදිරිපත් කරන්න.

3- 'කුඩා ව්‍යාපාරයක් ආරම්භ කර කෙටි කාලයකින් වැසීයාමට ලක්වේ.' මෙයට බලපාන මූලික හේතු දෙකක් සඳහන් කරන්න.

4- කුඩා පරිමාණ ව්‍යාපාර වලින් පාරිභෝගිකයාට හා මහා පරිමාණ ව්‍යාපාරවලට සිදුවන සේවාවන් එකක් බැගින් ඉදිරිපත් කරන්න.

5- කුඩා පරිමාණ ව්‍යාපාර වල සාර්ථකත්වය සඳහා ගතයුතු ක්‍රියාමාර්ග සඳහා ඔබේ යෝජනා දෙකක් ඉදිරිපත් කරන්න. (ලකුණු 2x5=10)

05. (i) 'ව්‍යවසායකත්වය' සංකල්පය පැහැදිලි කරන්න.
ව්‍යවසායකත්ව සංකල්පය බැඳි මූලික අදහස්වලින් දෙකක් ඉදිරිපත් කරන්න.

(ii) ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා රටක තිබිය යුතු තත්වයන් දෙකක් ඉදිරිපත් කරන්න.

(iii) 'ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් ආර්ථික වර්ධනය සිදුවේ.' මෙය සනාථ කිරීම සඳහා කරුණු දෙකක් ඉදිරිපත් කරන්න.

(iv) නව ව්‍යාපාරයක් ආරම්භ කරන වයවසායකයෙකුට පාරිභෝගිකයින් ආකර්ෂණය කර ගත හැකි පිවිසුම් මාර්ග දෙකක් ඉදිරිපත් කරන්න.

(v) රැකියාවක් කිරීම වෙනුවට ව්‍යවසායකයකු බවට පත්වීමුමෙන් ව්‍යවසායකුට පෞද්ගලිකව හිමිකර ගත හැකි ප්‍රතිලාභ හතරක් සඳහන් කරන්න.

(ලකුණු 2x5=10)

06. 1- 'ව්‍යාපාර සැලැස්මක්' තුලින් ව්‍යාපාරිකයාට ලබා ගත හැකි වාසි දෙකක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 02)

2- ව්‍යාපාර සැලැස්මක පවතින පහත සඳහන් මූලිකාංග කෙටියෙන් විස්තර කරන්න.

(අ) අලෙවි සැලැස්ම
(ආ) නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තුව
(ඇ) පරිපාලන කටයුතු පිළිබඳ ඇස්තමේන්තුව
(ඈ) මූල්‍ය ඇස්තමේන්තුව

(ලකුණු 2x4)
(මුළු ලකුණු 10)

අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර පත්‍රිකා සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

www.lol.lk
Learn Ordinary Level

LOL.lk
online Book Store

අමතන්න - 071 777 4440/0756999990/071 8540371



# LOL.lk
online Book Store

071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්










## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්














## කෙටි සටහන් පොත්










මිලදී ගැනීමට ඔබෙ ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

ප්‍රශ්නපත්‍ර පොත්
ගෙදරටම ගෙන්ව ගන්න
ඔන්ලයින් ඕඩර් කරන්න
WWW.LOL.LK
වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal VISA MasterCard DISCOVER
NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE
BOOK STORE

An evening of fun for young readers

